// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1880/6 - 2014 සැප්තැම්බර් මස 15 වැනි සඳුදා - 2014.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ පූර්වසේවා ගුරු පුහුණුව සඳහා මහරගම ගුරු විද්‍යාලය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් වශයෙන් උසස් කිරීම

1986 අංක 30 දරන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පනතේ 2(1) (අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2013 අප්‍රේල් මස 19 දින හා අංක 13/0529/530/019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2014 මැයි 9 වන දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, 2014.07.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස මහරගම ගුරු විද්‍යාලය, **"මහරගම ව්‍යවසායකත්ව හා කළමනාකරණ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය"** යන නාමයෙන් ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ පූර්ව සේවා ගුරු පුහුණුව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් වශයෙන් උසස් කරන ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

විෂයානුබද්ධ අවශ්‍යතා පාදකව මෙම විද්‍යාපීඨය නේවාසික නොවන ආයතනයක් ලෙස පවත්වනු ලබන අතර, සීමාවාසී පුහුණුව සඳහා අදාළ ශික්ෂණලාභීන් රජයේ පාසල් මෙන්ම දේශීය ව්‍යවසායකත්ව ආයතන වලට ද යොමු කරනු ලැබේ.

බන්දුල ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2014 අගෝස්තු මස 29 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

10-27

1A - G 20258 — 30 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.